

# කතෝලික ධර්මය

## 8 ශ්‍රේණිය



e තක්සලාව கல்விக்கூடம்™
The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa
Copyright © www.e-thaksalawa.moe.gov.lk



# 23 පාඩම - දේව වන්දනාවේ ප්‍රධාන අංග

1) පහත චිත්‍ර දෙස බලා දේව වන්දනාවේ ප්‍රධාන අංග තුන ලියන්න








2) දේව වන්දනාවේ උතුම්ම පිළිවෙත නම් කරන්න

3) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක පහත රූප සටහන් ඉදිරියෙන් ලියන්න






පී . ඩී ෆිලීෂියා අයිරින් කතෝලික ධර්මය ගුරුඋපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය කැළණිය

සැකසුම : ජී.කේ සත්‍ය ධනංජය ජයරත්න, හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය - වීරකැටිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk



4) දේව වචනය තුළ යහපත් දිවියක් ගත කරන්නට මඟ පෙන්වන ධර්මානුශාසනාව කුමක්ද?

..........................................................................................................................

..........................................................................................................................

5) ස්තෝත්‍ර යාගික පිළිවෙතෙහි අඩංගු කොටස් මොනවාද?

| | | |
|---|---|---|
| | | |

6) දේව ප්‍රසාද නිධාන යනු කුමක්ද?

..........................................................................................................................

..........................................................................................................................




Copyright © www.e-thaksalawa.moe.gov.lk



7) දේව ප්‍රසාද නිධාන 7 රූප සටහන් ඉදිරියෙන් නම් කරන්න





8) යාම යැදුම යනු කුමක්ද?

9) දේව වන්දනාවේ ප්‍රධාන අංග තුළින් ඔබ දේව ආදරයට නතු වන ආකාර 3ක් ලියන්න

10) දේව ප්‍රසාද නිධාන තුළින් අධ්‍යාත්මික පෝෂණයක් ලබා ගත හැකි ආකාර 2ක් ලියන්න



Copyright © www.e-thaksalawa.moe.gov.lk



**වසංගත සමයේ දිනපතා මෙම යාච්ඤාව බැතියෙන් යදිමු**

අති පරිශුද්ධ ලෝක රාජේශ්වරියනී,
මනුෂ්‍යය ජාතින්ගේ බලවන්ත මධ්‍යස්ථිකාවෙනි
මුළු මහත් ලෝකයම භයංකාර වසංගතයකින් වසාගෙන
සමස්ත මිනිස් සමාජයම අකර්මන්‍යව අඳුරු ආගාධයක ගිලෙමින් තිබෙන
මේ තීරණාත්මක මොහොතේදී ඔබ නිර්මල පාද පද්මය ළඟ දනින් වැටී
අප කරන මේ හෘදයාංගම කන්නලව්වට සවන් දීමට කරුණා කළ මැනව.
බිහිසුනු ව්‍යසන, විපත්ති, වසංගත, යුද්ධ සංග්‍රාම වලදී
අසරණ අපේ එකම සරණය වූ සෙනෙහෙවන්ත මෑණියනී,
අප මාතෘ භූමියට කිසිසේත්ම දැරිය නොහැකි මේ විනාශකාරී වසංගතය
ව්‍යාප්ත වීම වැළැක්වීමට කඩිනමින් මැදහත් වුව මැනව.
මිනිස් බුද්ධියෙන් හා පරිශ්‍රමයෙන් කළ හැකි හැමදේම කළ පසුත්
තවමත් මර්ධනය කරගැනීමට නොහැකි වූ මෙම රුදුරු
කොරෝනා රකුසාගෙන් අප රට වැසි සියලු දෙනා ද
මුළු ලෝක ජනතාව ද රැකගත මැනව.
දෙවන ලෝක යුද්ධ සමයේදී සතුරු හමුදාවන්ගේ
මරුකටින් අප බේරාගත් ලංකා අප ස්වාමිදුවෙනි,
මෙ භයානක වසංගත පීඩාවෙන් අප ආදරණීය මව්බිම ද
මුළු මහත් ලෝකයද බේරා දුන මැනව.
අනේ අති කරුණාබර කුමරි මෑණියනි,
මනුෂ්‍යයන්ගේ මුරණ්ඩුකමත් මුල මතක නැතිකමත් නිසා
අකීකරුකමින් සහ අධර්මිෂ්ඨකමින් ගෙවන ඔවුන්ගේ ආත්මාර්ථකාමී
පව්කාර පැවැත්මේ ප්‍රතිවිපාක ඔවුන්ට පෙන්වා දුන මැනව.
සියලු මනුෂ්‍යන් තුළ සැබෑ පසුතැවිල්ලක් හා
ප්‍රතිහාර්යාත්මක සිත් හැරීමක් ඇතිවීමට සැලැසුවුව මැනව.
දේව නීතියත් විශ්ව නීතියත් ප්‍රතික්ෂේප කරමින් දෙවියන් වහන්සේ
අපට දුන් මේ මනහර මැවිල්ලට මහත් සේ හානි පමුණුවමින්
මනුෂ්‍යයා පතන ප්‍රගතියේ අවසාන ප්‍රතිඵලය හිස් මායාවක් බව ඔවුනට
ප්‍රත්‍යක්ෂ කළ මැනව.
දේව කැමැත්තට හිස නැමීමේ දී කොන්දේසි වරහිතව එසේ කරමින්
ඉහළම ආදර්ශය අපට දුන් නිර්මල දේව මාතාවෙනි,
හෘද සාක්ෂියේ ශුද්ධ වූ හඬ ශබ්දයට සවන් දී දේව අභිමතයට යටහත් වී
සහෝදරත්වයේ සහ සහජීවනයේ සදාචාරසම්පන්න
සමාජයක් බිහි කිරීමට ඔබගේ මාතෘක මැදහත්කම තුළ
දෙවි පියාණන් වහන්සේගේ බහුල ආශිර්වාදය නිරතුරුව
අප සැමට ලබා දුන මැනව.
ආමෙන්.


පී . ඩී ෆිලීෂියා අයිරින් කතෝලික ධර්මය ගුරුඋපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය කැළණිය

සැකසුම : ජී.කේ සත්‍ය ධනංජය ජයරත්න, හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය - වීරකැටිය



Copyright © www.e-thaksalawa.moe.gov.lk